ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# මහජනතාව වෙත කෙරෙන දැනුම් දීමයි

## පහත සඳහන් ආකාර වලින් ලබා ගත් විදේශ මුදල් ඔබ අත තිබේ නම්...

I. විදේශ සංචාර සඳහා බැංකුවකින් හෝ බලයලත් මුදල් හුවමාරුකරන්නෙකුගෙන් මිලට ගත් නමුත් භාවිතයට නොගෙන ශ්‍රී ලංකාවට ආපසු ගෙන එන ලද විදේශ මුදල් (ඇ.එ.ජ.ඩො. 15,000 හෝ ඊට සමාන අගයකට වෙනත් විදේශ මුදල්),

II. විදේශ සංචාර සඳහා පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් ආපසු ගන්නා ලද විදේශ මුදල් (ඇ.එ.ජ.ඩො. 15,000 හෝ ඊට සමාන අගයකට වෙනත් විදේශ මුදල්),

III. විදේශයක දී කරන ලද රැකියාවෙන්, වෘත්තියෙන් හෝ ව්‍යාපාර වලින් උපයා ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ මුදල්,

IV. 2020 ජනවාරි 01 දින හෝ ඉන් පසුව විශේෂ තැන්පතු ගිණුම් වල තැන්පත් කිරීම සඳහා ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ මුදල්,

## පහත සඳහන් විකල්ප ක්‍රියා මාර්ග වල යෙදීමට ඔබට හැක...

- 2021 දෙසැම්බර් මාසය තුළ දී ඇ.එ.ජ. ඩොලරයකට රු. 210* බැගින් (අනෙකුත් විදේශ මුදල් සඳහා සමානුපාතිකව) ඕනෑම බැංකුවකින් ශ්‍රී ලංකා රුපියල් වලට මාරු කිරීම; හෝ
- 2021 දෙසැම්බර් මාසය තුළ දී ඇ.එ.ජ. ඩොලරයකට රු. 210* බැගින් (අනෙකුත් විදේශ මුදල් සඳහා සමානුපාතිකව) ඕනෑම බැංකුවක ශ්‍රී ලංකා රුපියල් ගිණුමක තැන්පත් කිරීම; හෝ
- ඕනෑම බැංකුවක ඔබේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ (Personal Foreign Currency Account) හෝ විශේෂ තැන්පතු ගිණුමේ (Special Deposit Account) තැන්පත් කිරීම; හෝ
- ඔබේ බැංකුව හරහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල ආයෝජනය කිරීම.

* රුපියල් 200 විනිමය අනුපාතය + රුපියල් 10 ක විශේෂ දිරි දීමනාව

**සටහන : ඉහත ගනුදෙනු සඳහා සියලුම බැංකු වෙත අවශ්‍ය උපදෙස් මහ බැංකුව නිකුත් කර ඇත.**

විදේශ විනිමය දෙපාර්තමේන්තුව, අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01.
☎ 0112477255 0112477716 @ dfe@cbsl.lk www.dfe.lk